**ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 06 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 485.3 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 459.16 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 26.14 ක් හෙවත් සියයට 5 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 435.30 | 423.76 | 11.54 | 2.65 |
| මූලධන | 50.00 | 35.40 | 14.60 | 29.20 |
| **එකතුව** | **485.30** | **459.16** | **26.14** | **5.39** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශ 20 ක් හා දෙපාර්තමේන්තු 19 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 1,940.85 ක් හා රු.මිලියන 313.86 ක් වශයෙන් එකතුව රු.මිලියන 2,254.71 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් පිළිවෙලින් රු.මිලියන 1,603.32 ක් හා රු.මිලියන 216.71 වශයෙන් එකතුව රු.මිලියන 1,820.03 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 337.53 ක් හා රු.මිලියන 97.15 වශයෙන් එකතුව රු.මිලියන 434.68 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 26001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 29.00 | 24.37 | 19.00 | 26.04 | 92.00 | 69.33 |

## 2.3 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ අංක 7002/000/00/0307/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 223.4 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 263.86 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0047/000 | 11.16 |
| 6000/0000/00/0002/0063/000 | 0.09 |
| 6000/0000/00/0016/0016/000 | 166.47 |
| 6000/0000/00/0017/0003/000 | 57.74 |
| 6000/0000/00/0018/0019/000 | 28.40 |
| | 263.86 |

## 2.5 විගණන නිරීක්ෂණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පවත්වා ගෙන යායුතු ස්ථාවර වත්කම් ලේඛනය 2015 දෙසැම්බර් 31 දින වන විටත් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 22 කට 2016 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 319.28 ක් විය.

### 3.3 විසර්ජන ගිණුම

#### 3.3.1 අයවැය විචලනය

මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයන් 4 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයන් ඉක්මවා එකතුව රු.3,345,384 ක බැරකම්වලට එළඹ තිබුණි.

#### 3.3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). විවිධ අමාත්‍යාංශ විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතිවල පහත සඳහන් පරිදි අඩුපාඩු අනාවරණය විය.

| ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අනාවරණය වූ අඩුපාඩු |
|---|---|---|
| (i) ක්‍රීඩා අමාත්‍යාංශය | මාදෙනිය මහා විද්‍යාලයේ ක්‍රීඩාගාරය ඉදිකිරීම - ප්‍රතිපාදනය - රු.975,409 | (i) වහලය සඳහා 50x50x5mm කෝණ යකඩ යෙදිය යුතු වුවත්, එසේ නොකර 38x38x5mm යකඩ යොදා ඒ සඳහා රු.31,500 ක් වැය කර තිබුණි. |
| | | (ii) ප්ලින්ත් ප්ලාස්ටර් කිරීම සිදු නොකර ඒ සඳහා රු.5,578 ක් ගෙවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | (iii) | වටපිල හා කාණු සුද මැදීම නොකර තිබියදී ඒ සඳහා රු.38,371 ක් ගෙවා තිබුණි. |
| | | | (iv) | බැහැර කාණු සුද මැද නොතිබුණි. |
| | | | (v) | ගේබල් රාෆ්ටර් සඳහා රු.17,147 ක අධි ගෙවීමක් සිදු කර තිබුණි. |
| (ii) | ක්‍රීඩා අමාත්‍යාංශය | නිශ්ශංකමල්ල විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම - ප්‍රතිපාදනය රු.1,764,000. | (i) | මීටර් 42 ක් පමණ දිගට ඉදිකළ මාර්ගය සඳහා මීටර් 48 ක් ලෙස සඳහන් කර රු.29,909 ක අධි ගෙවීමක් කර තිබුණි. |
| | | | (ii) | පිට්ටනිය වටා රු.610,500 ක් වැයකර ඉදිකළ කොන්ක්‍රීට් කාණුව සඳහා ඇස්තමේන්තුව පරිදි ආවරණ යොදා නොතිබුණි. |
| | | | (iii) | මාර්ගය ඉදිකිරීමට රු.191,775 ක් වැය කර තිබුණත්, එහි දැඩි බෑවුම් බව නිසා වාහන ධාවනයට යොදා ගත නොහැකි වී තිබුණි. |
| (iii) | ක්‍රීඩා අමාත්‍යාංශය | කොත්තැල්ලෙන විද්‍යාලයේ ක්‍රීඩා පිටියේ ක්‍රීඩාගාරය ඉදිකිරීම සඳහා රු.983,944 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. | (i) | ගෙබිම රු.57,359 ක් වැයකර ඉදිකර තිබුණත්, ප්‍රසාරණ මූට්ටු යොදා නොතිබීම නිසා ගෙබිම පුපුරා තිබුණි. |
| | | | (ii) | වහලයට 62x62x6mm කෝණ යකඩ දැමීම සඳහා රු.70,426 ක් ගෙවා තිබුණත් 50x50x5mm කෝණ යකඩ දමා තිබුණි. |
| (iv) | ක්‍රීඩා අමාත්‍යාංශය | අඹගමුව ලක්ෂපාන මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම හා ක්‍රීඩාගාරය ඉදිකිරීම සඳහා රු.1,959,425 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. | (i) | ක්‍රීඩාංගනයේ ගෙබිම ඉදිකිරීම සඳහා රු.71,625 ක් ගෙවා තිබුණත්, ප්‍රසාරණ මූට්ටු යොදා නොතිබීම නිසා එය පුපුරා තිබුණි. |
| | | | (ii) | වහලය සඳහා ඇස්තමේන්තුව ප්‍රකාරව 62x62x6mm කෝණ යකඩ දැමීම සඳහා රු.94,222 ක් ගෙවා තිබුණත්, 50x50x5mm කෝණ යකඩ යොදා තිබුණි. |
| | | | (iii) | 6" x9" ගල් යොදා කලුගල් බැම්ම ඉදිකිරීම සඳහා රු.687,168 ක් වැය කර තිබුණත් ඒ සඳහා 6" x9" ට වඩා විශාල මඩ කට්ට සහිත ගල් යොදා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (v) | ක්‍රීඩා අමාත්‍යාංශය | වික්ටෝරියා ජාතික විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය - ගිවිසුම්ගත මුදල රු.2,993,738 | (i) | 2015 දෙසැම්බර් 31 දින වන විට කර්මාන්තය නිම කළ යුතුව තිබුණත්, එදින වන විට කර්මාන්තයේ වටිනාකමින් සියයට 1.4 ක ප්‍රමාණයක් පමණක් නිම කර තිබුණි. |
| | | | (ii) | මීටර් 400 ක ධාවන පථය වටා කොන්ක්‍රීට් කාණු යෙදිය යුතු වුවද, ඉංජිනේරුවරයාගේ අනුමැතිය නොමැතිව මීටර් 200 ක ධාවන පථයක් සකසා එය වටා කාණු පද්ධතියක් ඉදි කරමින් පැවතුණි. |
| (vi) | ක්‍රීඩා අමාත්‍යාංශය | හඟුරන්කෙත දියතිලක මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය ඉදිකිරීම - ගිවිසුම්ගත මුදල රු.3,795,750 | | 2015 දෙසැම්බර් 20 දින වන විට ඉදිකිරීම් කටයුතු නිම කළ යුතු වුවත්, 2016 පෙබරවාරි 29 දින වන විටත් නිමකර නොතිබුණි. |
| | | | | 2015 දෙසැම්බර් 20 දින වන විට ඉදිකිරීම් කටයුතු නිම කළ යුතු වුවත්, 2016 පෙබරවාරි 29 දින වන විටත් නිමකර නොතිබුණි. |
| | | | | කොන්ක්‍රීට්වල ශක්තිය පිළිබඳ රසායනාගාර පරීක්ෂා කිරීමකින් තොරව මීටර් 20 ක් සඳහා රු.695,890 ක් ගෙවා තිබුණි. |
| | | | | පිට්ටනිය වටා යොදා තිබුණු කොන්ක්‍රීට් කණුවල ආවරණ දුර්වල ප්‍රමිතියකින් යුතුව තිබුණු අතර, 2016 පෙබරවාරි 29 දින වන විට කොන්ක්‍රීට් ආවරණ ගණනාවක් කැඩී තිබුණි. |
| (vii) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | අඹගමුව විමලසුරේන්ද්‍ර ගම පොදු සුසානභූමිය වටා වැටක් ඉදිකිරීම- ප්‍රතිපාදනය රු.490,000. | | ප්‍රමිතියෙන් තොර කොන්ක්‍රීට් කණු හා කටු කම්බි යොදා වැට ඉදිකර තිබුණත්, ඒ සඳහා ඇස්තමේන්තුගත රු.309,869 ක් ගෙවා තිබුණි. |
| (viii) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | මස්කෙලිය ශාන්ත ජෝෂප් දෙමළ විද්‍යාලයේ 20'x30' ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම- ප්‍රතිපාදනය රු.990,000. | (i) | වහලයට යකඩ කාප්ප හා පර්ලින් සඳහා 62x62x6mm කෝණ යකඩ යෙදිය යුතු වුවත්, ඒ සඳහා 40x40x5mm කෝණ යකඩ යෙදීම නිසා ඇස්තමේන්තු කළ පරිදි කර්මාන්තය ඉටුකර නොගෙන, |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ඇස්තමේන්තු වටිනාකම මෙන් සියයට 50 ක් අඩුකර රු.197,651 ක් ගෙවා තිබුණි. |
| | | | (ii) | වහලයේ හැඩය ඇස්බැස්ටෝස් ෂීට් වහලයට ප්‍රමාණවත් වී නොතිබුණු අතර, ඇස්තමේන්තුව පරිදි Close Fitting වර්ගයේ රිජින් යොදා නොතිබුණද, ඒ සඳහා රු.11,055 ක් ගෙවා තිබුණි. |
| | | | (iii) | නිසි නිමාවකින් තොරව සවිකර තිබූ දොර පුපුරා තිබුණත්, ඒ සඳහා රු.28,758 ක් ගෙවා තිබුණි. |
| | | | (iv) | ගොඩනැගිල්ල වටා වටපිල හා කාණු 32.5m ක් ඉදිකර ඒ සඳහා රු.85,443 ක් වැය කර තිබුණත්, ගොඩනැගිල්ල වටා එය සම්පූර්ණ කර ඉදිකර නොතිබුණි. |
| (ix) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | අඹගමුව ප්‍රාදේශීය සභාව විසින් අධීක්ෂණය කළ 2015 නොවැම්බර් 15 දින වන විටත් ඉදිකිරීම් ආරම්භ නොකළ ව්‍යාපෘති 4 ක් - ප්‍රතිපාදනය රු.2,783,331. | | කාර්මික නිලධාරි විසින් වැඩ ආරම්භ කළ බවට ලබාදුන් සාවද්‍ය වාර්තා පදනම් කරගෙන රු.494,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි. |
| (x) | -එම- | පතන ප්‍රජාශාලාව සංවර්ධනය කිරීමේ කර්මාන්තය - ගිවිසුම්ගත වටිනාකම රු.490,000. | (i) | අදාළ කර්මාන්තය 2015 නොවැම්බර් 05 දින නිමකළ යුතුව තිබුණත්, 2015 නොවැම්බර් 24 දින වන විටත් නිමකර නොතිබුණි. |
| | | | (ii) | ඇස්තමේන්තුව ප්‍රකාරව යකඩ පර්ලින් හා කාප්ප යෙදිය යුතු වුවත්, ඒ වෙනුවට එලය සහිත (නොමේරූ) දැව යොදා ගෙන තිබුණි. |
| | | | (iii) | ප්‍රමිතියෙන් තොර බ්ලොක් ගල් යොදා තිබුණු අතර, ඒ සඳහා රු.105,040 ක් වැය කර තිබුණි. |
| (xi) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | අඹගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්ලෙවර්ටන් කොටස මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය - ගිවිසුම්ගත මුදල රු.1,654,546 | (i) | මාර්ගයේ ස්ථාන කිහිපයක් පුපුරා තිබුණි. |
| | | | (ii) | ඇතැම් ස්ථානවල කොන්ක්‍රීට්වල පැවතිය යුතු ඝනකම නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (xii) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | හඟුරන්කෙත හෝප්වත්ත මැද කොටසට ජලය ලබාදීමේ ව්‍යාපෘතිය- ව්‍යාපෘති පිරිවැය රු. 198,000 | | රජයේ ව්‍යාපෘතියකට P.V.C නළ භාවිතා කිරීමේදි 1000 type නළ භාවිතා කළ යුතු වුවත්, ජල පීඩනයට ඔරොත්තු නොදෙන 600 type නළ භාවිතා කර රු.178,200 ක් වැය කර තිබුණි. |
| (xiii) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාර්ග 3 ක් ඉදිකිරීමේ ව්‍යාපෘති - ඇස්තමේන්තු පිරිවැය රු.1,666,000 | (i) | මාර්ග 3 ක ඉදිකිරීම සඳහා භාවිතා කළ යුතු මි.මී.19 කැටගල් වෙනුවට මි.මී.25 හා මි.මී.37 කැටගල් භාවිතා කර තිබුණි. |
| | | | (ii) | ඉදිකිරීම්වල ප්‍රමිතිය කාර්මික නිලධාරින් හෝ සහකාර අධ්‍යක්ෂ පරික්ෂා කළ බවට කිසිදු ලොග් සටහනක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ivx) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුරුඳුවත්ත ගමමැද මාර්ගය ඉන්ටර්ලොක් කිරීමේ කර්මාන්තය- වියදම රු.490,000 | | 2015 නොවැම්බර් 06 දින වන විට යොදා ගෙන තිබුණු කැටගල්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරය වෙත යොමුකර නොතිබුණි. 2015 නොවැම්බර් 09 දින විගණන අවස්ථාවේ ලබාගෙන පරීක්ෂා කළ කැටගල්වල ශක්තිය $10.6N/mm^2$ ක් පමණක් වී තිබීම නිසා ඉදිකිරීම් ප්‍රමිතිය අපේක්ෂිත මට්ටමක නොතිබුණි. |
| (xv) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාර්ග 03 ක් ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම - වියදම රු.1,960,000 | | ඉන්ටර්ලොක් ගල්වල ප්‍රමිතිය රසායනාගාර පර්යේෂණ වාර්තාවෙන් තහවුරු කර ගැනීමට පෙර ගෙවීම් කර තිබුණි. |
| (xvi) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | හඟුරන්කෙත ප්‍රජා ජල ව්‍යාපෘතියේ ජලය ගබඩා කරන ටැංකි සඳහා ආරක්ෂිත වැටක් ඉදිකිරීමේ කර්මාන්ත දෙකක් - වියදම රු.690,404 | (i) | ප්‍රමිතියෙන් තොර කටු කම්බි යොදා ගෙන තිබුණු අතර, ඒ සඳහා රු.485,851 ක් වැය කර තිබුණි. |
| | | | (ii) | කම්බි කණුවල 6 mm කම්බි 04 ක් යෙදිය යුතු වුවත්, එක් කම්බියක් පමණක් යොදා තිබුණි. |
| | | | (iii) | නාම පුවරුව සඳහා රු.6,000 ක් ගෙවා තිබුණත්, නාම පුවරුව සවිකර නොතිබුණි. |
| (xvii) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | හඟුරන්කෙත අඹේවෙල බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය - ඇස්තමේන්තුගත වටිනාකම | (i) | ගොඩනැගිල්ලේ වහල නිසි ප්‍රමිතියෙන් තොරව ඉදිකර තිබුණත්, ඒ සඳහා රු 195,720ක් ගෙවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.980,000 | (ii) | කොස් දැවයෙන් දොර නිමකළ යුතු වුවත්, වෙනත් දැව යොදා කලම්ප දොරවල් සවිකර තිබුණි. |
| | | | (iii) | බාල වර්ගයේ දොර ලොක් යොදා අහල් 4 සරනේරු වෙනුවට අහල් 3 සරනේරු යොදා ඒ සඳහා රු.65,897 ක් වැය කර තිබුණි. |
| (xviii) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ක්‍රියාත්මක කළ දෙහිගස්තැන්න අඹතලාව (මල්ලිකා) ප්‍රජා ශාලාව සංවර්ධනය කිරීම- කොන්ත්‍රාත් වටිනාකම රු.490,000 | (i) | ගොඩනැගිල්ලේ දොර හා උළුවහු අමු ලී වලින් පිළියෙල කර තිබීම නිසා 2016 මැයි 05 දින වන විට ඒවායේ ලී මුට්ටු ඇත්වී තිබුණි. |
| | | | (ii) | Cl 01 දැවයෙන් Flush paneled දොරවල් 04 ක් යෙදිය යුතු වුවත්, ඒ සඳහා Battle දොරවල් 02ක් යොදා රු.107,250 ක් ගෙවා තිබුණි. |
| | | | (iii) | ගොඩනැගිල්ල වටා ශක්තිමත් භාවයෙන් තොර දැල් ආවරණය කර ඒ සඳහා රු.44,486 ක් ගෙවා තිබුණි. |
| | | | (iv) | වැසිකිලියක් ඉදිකිරීම සඳහා රු.90,000 ක් වැය කර තිබුණත්, එහි දොර උළුවස්ස රහිතව සවිකර තිබුණි. |
| | | | (v) | පිටුපස පිල පුපුරා තිබුණත්, ඒ සඳහා රු.22,382 ක් ගෙවීම් කර තිබුණි |
| (xix) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ කඳපොල පාර්ක්වත්ත විද්‍යාලය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය - ගිවිසුම්ගත වටිනාකම රු.490,000 | (i) | 2015 මැයි 26 දින ගිවිසුම් අත්සන් කර තිබුණත්, ඊට පෙර 2015 මාර්තු 15 දින කොන්ත්‍රාත්තුව ආරම්භ කර තිබුණි. |
| | | | (ii) | වටපිල ඉදිකිරීම සඳහා රු.165,123 ක් වැය කර තිබුණත්, සුද මැදීමෙන් පසු ජලය යොදවා නොතීම නිසා පුපුරා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | | (iii) ඇතුළත හා පිටත තීන්ත ආලේපය සඳහා පිළිවෙලින් රු.53,667 ක් හා රු.48,165 ක් ගෙවා තිබුණ අතර, එහි නිමාව අතිශය දුර්වලවී තිබුණි. |
| (xx) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ නානුඔය බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම - ඇස්තමේන්තුගත පිරිවැය රු.1,250,000 | ගෙබිම කොන්ක්‍රීට් කිරීම, කපරාරු කිරීම, ජනෙල් දොරවල් දැමීම හා විදුලි සැපයුම ඇස්තමේන්තුව පරිදි ඉටු කර නොතිබුණි. ඒ සඳහා රු.870,124 ක් ගෙවා තිබුණත්, ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. |
| (xxi) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යුලිෆීල්ඩ් මාතෘ හා ළමා සෞඛ්‍ය සායන ගොඩනැගිල්ල ඉදිකිරීම -ඇස්තමේන්තු වටිනාකම රු.980,000 | (i) වහලය සඳහා යොදා තිබුණු ඇස්බැස්ටෝස් ෂීට් ගණනාවක් පුපුරා තිබුණත් ඒ සඳහා රු.61,465 ක් ගෙවා තිබුණි.<br>(ii) සිවිලිමේ ෂීට් 2 ක් අතර යෙදිය යුතු 2″x2″ ලී එම පරිමාණයෙන් යොදා නොතිබුණු අතර, ස්කෲ ඇණ වෙනුවට කම්බි ඇණ භාවිතා කර තිබුණි. ඒ සඳහා රු.49,089 ක් ගෙවා තිබුණි.<br>(iii) ඇස්තමේන්තුව අනුව ගෙබිම සඳහා මැට් වර්ගයේ ටයිල් ඇල්ලීම සඳහා රු.129,180 ක් ගෙවිය යුතු වුවත්, ඒ සඳහා ග්ලොස් ෆිනිෂ් ටයිල් යොදා තිබුණි.<br>(iv) ගේබල් රාෆ්ටර් වෙනුවට සී පර්ලින් 02 ක් පාස්සා වහලය නිමවා තිබීම නිසා එහි ගුණාත්මක බවක් නොතිබුණි.<br>(v) බ්ලොක් ගල් සඳහා රු.116,817 ක් වැයකර SLS ප්‍රමිතියෙන් තොර බ්ලොක් ගල් යෙදීම නිසා බිත්ති තැනින් තැන පුපුරා තිබුණි.<br>(vi) 9″ x 9″ පරතරයට වැහි පිහිලි සඳහා කොකු යෙදිය යුතු වුවත් 24″ පමණ පරතරයකින් කොකු ඇණයොදා තිබියදී ඒ සඳහා රු.23,981 ක් ගෙවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | (vii) | සවිකර තිබූ විදුලි මනුවේ විදුලි ජේනු 2 ක් පමණක් පැවතුණ අතර, ප්‍රධාන පුවරුවේ ටිප් ස්විචය සවිකර නොතිබුණත්, ඒ සඳහා රු.9,287 ක් ගෙවා තිබුණි |
| (xxii) | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ හාතියපුර ප්‍රජා ශාලාව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය-ඇස්තමේන්තු පිරිවැය රු.980,000 | (i) | සිවිලිම සඳහා යෙදිය යුතු 2″x2″ ලී ඇස්තමේන්තුව අනුව අදාල පරතරයෙන් යොදා නොතිබුණි. |
| | | | (ii) | සිවිලින් ෂීට් අතර යෙදිය යුතු බීඩින් වෙනුවට පොටි යොදා තිබුණි. |
| | | | (iii) | ගෙබිම සඳහා මැට් වර්ගයේ ටයිල් යෙදිය යුතු වුවත්, ඒ සඳහා ග්ලොස් ෆිනිෂ් ටයිල් යොදා තිබුණි. |
| | | | (iv) | වටපිල සුද මැදීමෙන් පසු ජලය නොයෙදීම නිසා පුපුරා තිබුණි. |
| (xxiii) | ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය | දිවාසුරැකුම් මධ්‍යස්ථානය ඉදිකිරීම-ගිවිසුම්ගත මුදල 2014 - රු.6,933,977 2015 – රු.7,967,090 | (i) | 2014 වර්ෂයේදී කොන්ත්‍රාත්කරු සමඟ එළඹ තිබුණු ගිවිසුම අනුව දින 75 කින් නිම කළ යුතු වුවත්, එම කාලය 2015 මාර්තු 15 දින දක්වා තවත් දින 90 කින් දීර්ඝ කර තිබුණි. දීර්ඝ කළ කාලයද ඉකුත් වී තිබුණත්, ඉදිකිරීම් කටයුතුවල වැඩ ඉටු කළ වටිනාකම රු.3,165,381 ක් වී තිබුණි. |
| | | | (ii) | කොන්ත්‍රාතු ගිවිසුම් අනුව දිනකට ප්‍රමාද ගාස්තුව කොන්ත්‍රාත් වටිනාකමින් 1/2000 ක් විය යුතු වුවත්, එය සතියකට 1/4000 ක් ලෙස ගිවිසුම්වලට එළඹීම නිසා දිනක ප්‍රමාද ගාස්තුව රු.3,698 ක් අඩුවෙන් ගිවිසුම්වලට එළඹ තිබුණි. |
| | | | (v) | පිටුපස පිල පුපුරා තිබුණත්, ඒ සඳහා රු.22,382 ක් ගෙවීම් කර තිබුණි. |
| (xxiv) | සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | ගම් 15,000 ක් නඟා සිටුවීමේ ව්‍යාපෘතිය, දොරින් දොරට ගමින් ගමට වැඩසටහන හා ග්‍රාමීය ප්‍රජා සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන් යටතේ | | සමාලෝචිත වර්ෂ අවසානයේදී ව්‍යාපෘති 555 ක් පමණක් නිමකර තිබුණි. හඟුරන්කෙත කළාපයේ ව්‍යාපෘති 5 ක් ආරම්භ කර නොතිබුණු අතර ව්‍යාපෘති 20 ක ප්‍රගතිය සියයට 25 කට අඩු මට්ටමක පැවතුණි. |

| | | | |
|---|---|---|---|
| | | වැඩසටහන් 03 ක් මගින් ව්‍යාපෘති 691 ක් ක්‍රියාවට නැංවීම - ප්‍රතිපාදනය රු.මිලියන 499.7 ක්. | |
| (xxv) | කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | ව්‍යාපෘති 225 ක් ක්‍රියාවට නැංවීම - ප්‍රතිපාදනය රු.මිලියන 101.45 | ව්‍යාපෘති 198 ක් පමණක් නිම කර තිබුණි. ඒවායේ මූල්‍ය ප්‍රගතිය සියයට 81 ක් වී තිබුණි. තවද ව්‍යාපෘති 23 ක ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු විය. |
| (xxvi) | සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩාපිටි සංවර්ධන කටයුතු - ප්‍රතිපාදනය රු.මිලියන 122. | වර්ෂ අවසානය වන විට ඉන් රු.මිලියන 76.77 ක් හෙවත් ලබාදී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 63 ක ප්‍රමාණයක් වැය කර තිබුණි. මෙමගින් ක්‍රීඩා පිටි 120 ක ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කර තිබුණද, ඉන් ක්‍රීඩා පිටි 94 ක ඉදිකිරීම් කටයුතු නිම කර තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අධීක්ෂණය කළ, වලපනේ කොට්ඨාශය තුළ ක්‍රීඩා පිටි 04 ක් නිම කිරීම සඳහා රු.මිලියන 21.24 ක කොන්ත්‍රාත්වලින් වර්ෂය අවසානයට ඉන් සියයට 2.7 ක මූල්‍යමය වටිනාකමක් ඇති වැඩ කොටස් පමණක් නිම කර තිබුණි. |
| (xxvii) | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කිරීම - ප්‍රතිපාදනය රු.මිලියන 7.88 ක්. | ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3.14 ක් හෙවත් සියයට 40 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි. දික්ඔය ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා 2014 වර්ෂයේ සකස් කළ ව්‍යාපෘති වාර්තාවකට අනුව 2015 අප්‍රේල් 01 දින රු. මිලියන 5.91 ක ප්‍රතිපාදන ලබා දි තිබුණත්, අනවසර ඉදිකිරීම් ඉවත් නොකර ව්‍යාපෘතිය ඉටු කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල නොලැබෙන බව පවසා 2015 ජුනි 10 දිනැති අංක NE/25/DMC/44 දරන ලිපිය මඟින් ඒ සඳහා සලසා දී තිබුණු මුළු ප්‍රතිපාදනයම ආපසු හරවා යවා තිබුණි. ඉන් පසු මේ සම්බන්ධයෙන් කිසිදු පසු විපරම් කිරීමක් සිදුකර නොතිබුණි. |
| (xxviii) | කෘෂිකර්ම දෙපාර්තමේන්තු | බීජ අර්තාපල් නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන - ප්‍රතිපාදනය රු.මිලියන 16 ක් | 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා 2015 පෙබරවාරි 24 දින රු.මිලියන 16 ක ප්‍රතිපාදන ලබා දී තිබුණත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වගකීමක් නොවන බව පවසා රුපියල් මිලියන 12.35 ක ප්‍රතිපාදන නැවත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත 2015 ජුනි 24 දින පවරා දී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (xxix) | ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය | 2014 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති 363 ක් නිම කිරිම - ප්‍රතිපාදනය රු.මිලියන 156.06 | 2014 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති 363 ක් නිම කිරීම සඳහා රු. මිලියන 223.51 ක ප්‍රතිපාදන අවශ්‍ය වී තිබුණි. නමුත් ඒ සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් රු. මිලියන 156.06 ක ප්‍රතිපාදන 2015 වර්ෂයේදී ලබා දී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට වැඩ නිම කර තිබුණු ව්‍යාපෘති සඳහා රු.මිලියන රු.70.97 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව තවදුරටත් රු.මිලියන 152.54 ක ප්‍රතිපාදන අවශ්‍ය ව්‍යාපෘති 313 ක් නිමකළ නොහැකිව පැවතුණි. |
| (xxx) | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2015 වර්ෂය වන විට නිම නොකළ ව්‍යාපෘති 13 ක් සඳහා වැය කළ මුදල රු.මිලියන 8.47 | 2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ ව්‍යාපෘති 2759 ක් ක්‍රියාවට නංවා වැඩ අවසන් නොවූ ව්‍යාපෘති 313 ක් 2015 වර්ෂයට අවිච්ඡේද කර හෝ නිම නොකිරීම හේතුවෙන් ඒවා සම්පූර්ණ නොකිරීම නිසා මහජනයාට කිසිදු ප්‍රයෝජනයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. නියැදි විගණන පරික්ෂණයට ලක් වු එවැනි ව්‍යාපෘති 13 ක් සඳහා රු.මිලියන 8.46 ක් වැ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොවූ නිසා වැය කළ මුදල නිෂ්ඵල වී තිබුණි. |
| (xxxi) | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | බැරකම් නිරවුල් කිරිම - රු.මිලියන 260.15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සඳහා 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු අතැති රු. මිලියන 260.15 ක බිල්පත් පියවීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් මුදල් ලබා දී තිබුණි. නමුත් 2015 දෙසැම්බර් 31 දිනට අතැති බිල්පත්වලින් රු.මිලියන 209.89 ක බිල්පත් පමණක් නිරවුල් කර තිබුණි. ඒ අනුව අතැති බිල්පත් රහිතව මුදල් ලබා ගැනීම නිසා රු. මිලියන 50.26 ක් අතිරික්ත වී තිබුණි. |

(ආ) දින 100 රජයේ විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක වු ගම් නගා සිටුවීමේ වැඩ සටහන -2015 යටතේ වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත 2015 අප්‍රේල් 02 දින අනුමත කළ ව්‍යාපෘති 151 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 මැයි 15 දින රු.මිලියන 123.75 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. ඉන් එක් ව්‍යාපෘතියක් සඳහා රු.500,000 ක ප්‍රතිපාදන ලැබී තිබු නමුත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 16 ක භෞතික ප්‍රගතිය සියයට 26 ක සිට සියයට 50 ක් දක්වා පරාසයක ප්‍රමාණයක පැවැති අතර, තවත් ව්‍යාපෘති 05 ක එදින වන විට භෞතික ප්‍රගතිය සියයට 51 ක සිට සියයට 75 ක් දක්වා පරාසයක ප්‍රමාණයක පැවති බව නිරීක්ෂණය විය.

( ඇ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් රුපියල් මිලියන 208.62 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබුණත් ඉන් රු.මිලියන 130.67 පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු රු.මිලියන 77.95 ක් හෙවත් සියයට 37 ක්වූ ප්‍රතිපාදන වර්ෂ අවසානය වන විටත් උපයෝජනය කර නොතිබුණි. අපේක්ෂිත ප්‍රතිපාදන රඳවාගෙන ඉතිරිය පවරාදෙන ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ 2015 දෙසැම්බර් 02 දිනැති අංක වි/වැ/ශි/17 දරන ලිපිය මඟින් ඉල්ලා තිබුණත් මෙම ප්‍රතිපාදන හරවා යැවීමට වර්ෂ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.4 අග්‍රිම ගිණුම්

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2012 වර්ෂයේදී බාහිර කොන්ත්‍රාත්කරුවෙකු වෙත අත්තිකාරම් ගෙවා තිබුණි. 2016 අප්‍රේල් 16 දින වන විටත් එම අත්තිකාරම් මුදලින් රු. මිලියන 1.08 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබීම නිසා රජයේ මුදල් බාහිර පාර්ශවයන් අත රඳවා ගැනීමට දිස්ත්‍රික් ලේකම් විසින් ඉඩ ප්‍රස්ථා ලබාදී තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට නොපිය වූ අග්‍රිම ශේෂය භාණ්ඩාගාර පොත් අනුව රු.මිලියන 223.40 ක් වී තිබුණි. මෙම ශේෂය භාණ්ඩාගාරය වෙත 2016 ජනවාරි 12 දින රු.මිලියන 211.26 ක් හා 2016 පෙබරවාරි 23 දින රු. මිලියන 10.44 ක් වශයෙන් එකතුව රු. මිලියන 221.71 ක් පියවා තිබුණි. තවදුරටත් නොපියවූ ඉතිරි රු.619,955 ක් 2016 අප්‍රේල් 15 දින වන විටත් පියවා නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වලපනේ හා කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් අවස්ථා 04 කදී දෙන ලද එකතුව රු. 62,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිමය පියවා නොතිබුණි. අවස්ථා 25 කදී දෙන ලද තත්කාර්ය අතුරු අග්‍රිම එකතුව රු.390,250 ක් කාර්යය නිමවා වැඩ කරන දින 04 ක සිට මාස 09 ක් දක්වා කාලපරාසයක් ප්‍රමාද කර පියවා තිබුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු. 8,461,531 ක්වූ තැන්පතු 242 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ගිණුමේ දක්වා තිබූ පොදු තැන්පත් ගිණුමේ ශේෂය හා ඒ ඒ ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් පිළියෙල කර ඉදිරිපත් කර තිබූ විසර්ජන ගිණුම්වල පොදු තැන්පත් ශේෂය අතර එකතුව රු.3,911,150 ක වෙනසක් පැවැතුණි.

(ඇ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අවස්ථා 18 කදී විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු එකතුව රු.1,436,365 ක ප්‍රතිපාදන අදාල කාර්යයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 26001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,033,996 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 6 ක සිට වර්ෂ 09ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව හා 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයට පටහැනිව නිලධාරියෙකු වෙත රු.316,700 ක ආපදා ණය ප්‍රදානය කර තිබුණි.

(ඇ) අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ හා වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක කේවල ශේෂ අතර රු.27,414ක වෙනසක් පැවතුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| මෝටර් වාහන | 29 | වර්ෂ 02 |
| වෙනත් වත්කම් | 01 | වර්ෂ 01 |

(ii). අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැරණි සම්මන්ත්‍රණ ශාලා ගොඩනැගිල්ල මැතිවරණ දෙපාර්තමේන්තුවේ නියෝග මත 2015 ජනවාරි 09 දින මුද්‍රා තබා තිබූ අතර, එදින සිට 2016 පෙබරවාරි 16 දින වන විටත් එම ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි.

(iii). අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.6,372,291 ක් වටිනා භාණ්ඩ අයිතම 64 ක් මිලදී ගෙන 2016 අප්‍රේල් 27 දින වන විට මාස 14 කට අධික කාලයක් ගතවී තිබුණත්, එම භාණ්ඩ බෙදා නොදී ගබඩාවේ රඳවා තිබුණි.

(iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක එකතුව රු.3,152,347 ක් වටිනා භාණ්ඩ අයිතම 23 ක් මිලදී ගෙන 2016 මාර්තු 29 දින වන විට මාස 14 ක් ඉක්මවා තිබුණත්, එම භාණ්ඩ බෙදා හැරීමකින් තොරව ගබඩාවේ රඳවා තිබුණි.

(v) ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක විශේෂ ව්‍යාපෘති (ජීවනෝපාය සංවර්ධන) යටතේ 2014 වර්ෂයේදී මිලදීගත් රු.292,500 ක් වටිනා මහන මැෂින් 26 ක් සහ රු.675,974 ක් වටිනා ස්ප්‍රේ යන්ත්‍ර 21 ක් 2016 අප්‍රේල් 28 දින වන විටද අදාළ ප්‍රතිලාභීන් වෙත බෙදා හැර නොතිබුණි.

(vi) විමධ්‍යගත යෝජනා යටතේ අඩු ආදායම්ලාභී පවුල්වලට බෙදා හැරීම සඳහා ලබාදී තිබූ සෙවිලි තහඩු 20 ක් සහ තවත් සෙවිලි තහඩු 60 ක් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිෂ්කාර්යව පැවැතුණි.

(vii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් වෙනත් අමාත්‍යාංශ ප්‍රතිපාදනවල පරිපාලන වියදම් මගින් අත්පත් කරගෙන තිබුණු රු.5,147,079 ක මූලධන වත්කම්, විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ දක්වා නොතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **වත්කම් වර්ගය** | **වත්කම් අයත්ව තිබුණු ආයතනය** | **වටිනාකම** | **කාල පරිච්ඡේදය** |
|---|---|---|---|
| | | **රු.මිලියන** | |
| ඉඩම් | මහවැලි සංවර්ධන අධිකාරිය | - | වසර 25 |
| මෝටර් වාහන | කෘෂිකර්ම අමාත්‍යාංශය | 02 | වසර 12 |

## 3.8 බේරුම් නොකළ බැරකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 1 ට අඩු කාලයක සිට පැවත එන රු.3,345,384 ක බැරකම් විය.

## 3.9 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.** | | | |
| (i) | මුදල් රෙගුලාසි 115(3)(අ) | 2,423,913 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 07 කදී අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ඉකුත් වර්ෂයට අදාල බැරකම් නිරවුල් කර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 137 | 5,971,165 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක් විසින් වියදම සහතික කිරීමකින් තොරව අවස්ථා 37 කදී ගෙවීම් කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 139(1) | 122,776,236 | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය විසින් වැය කර තිබුණු රු.122,776,236 ක් වටිනා ගෙවීම් වවුචර් අදාළ බලධාරින් විසින් සහතික නොකර ගෙවීම් කර තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 257 | 68,572,519 | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලයේ වවුචර් සහතික කර නොතිබියදී ගෙවීම්කර තිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 262(2) | 3,851,418 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 23කදී ගෙවන ලද වවුචර්වලත් ඒවා තහවුරු කෙරෙන ලියවිලිවලත් "ගෙවන ලදී " මුද්‍රාව යෙදිය යුතු වුවත් අදාල වවුචර්වල ගෙවූ බවට මුද්‍රා තබා නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 262 (3) | 16,491,155 | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලයේ ගෙවීම් වවුචර්වල පිළියෙල කළ බවට කෙටි අත්සන යොදා නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | |
| | 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PT/437 දරන චක්‍රලේඛය | - | ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකකට අයත් වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබූ අතර වාහන සඳහා රක්ෂණ ආවරණද ලබාගෙන නොතිබුණි. |

(ඇ) අනෙකුත් චක්‍රලේඛ ලිපි

| | | | |
|---|---|---|---|
| (i) | 2015 අප්‍රේල් 10 දිනැති ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | 776,940 | ගර්භණී මාතාවන් සඳහා රු.2,000 ක් වටිනා පෝෂණ මල්ලක් බැගින් ලබාදිය යුතු වුවද, එයට වඩා අඩු වටිනාකමකින් යුතු පෝෂණ මළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 ක ලබාදී තිබූ අතර, ඒ අනුව රු 776,940 .ක් අඩුවෙන් පෝෂණ මළු ලබාදී තිබුණි. |
| (ii) | 2015 අප්‍රේල් 24 දිනැති අංක PL/7/3/ යතුරු පැදි දරන රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ ලිපිය | 584,760 | රාජ්‍ය සේවකයකු ලෙස හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු ලෙස රජය විසින් ලබාදෙන ලද යතුරු පැදි දෙක බැගින් නිලධාරීන් තිදෙනෙකු විසින් ලබාගෙන තිබුණද යතුරු පැදි 3 ක වටිනාකම අයකර ගැනීමට හා නීතිමය හෝ විනය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.10 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| | **ව්‍යාපෘතිය** | **ඇස්තමේන්තුගත පිරිවැය**<br>රු. | **ව්‍යාපෘති ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන්** |
|---|---|---|---|
| (i) | පීලි හතර ඇල මාර්ගය පැති බැම්ම සකස් කිරීම. | 635,115 | ප්‍රදේශවාසීන්ගේ විරෝධය. |
| (ii) | සමනළගම සිට MR නගරයට ඇති අතුරු මාර්ගයට පැති බැම්ම ඉදිකිරීම. | - | ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය (NBRO) විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ඉහත ව්‍යාපෘතිය සුදුසු නැති බවට නිර්දේශ කිරීම. |
| (iii) | ඉඩමලන්ද බෝගස්පිටිය පාලම සකස් කිරීම. | 665,000 | කොන්ත්‍රාත්කරු ගිණුම් වර්ෂය තුළ වැඩ අවසන් කර නොතිබුණු බැවින් අදාළ ගිවිසුම්ගත සමිතිය අසාධු ලේඛන ගත කර ඇත. |
| (iv) | පල්ලේපිටිය මාර්ගයේ ඉතිරි කොටස පාලම දක්වා සංවර්ධනය කිරීම. | 503,064 | -එම- |

| | | | |
|---|---|---|---|
| (v) | බෝධිඇලෙන් පහළ වෙල්යාය සම්බන්ධවන පල්ලෙහා වෙල කෘෂි පාර. | 627,356 | -එම- |
| (vi) | උඩතැන්නේ මදුරාවේ වත්ත පාර සංවර්ධනය කිරීම - 11 | 300,785 | -එම- |
| (vii) | මාළිගාතැන්න කොළණිය පාර කොන්ක්‍රිට් කිරීම -11 | 657,538 | -එම- |
| (viii) | වැව්වෙල්ලේ සිට මා ඇල දක්වා මාර්ගය පැති බැමි යොදා සංවර්ධනය කිරීම. | 751,909 | -එම- |
| (ix) | මැද ගම්මැද්ද කෘෂි මාර්ගය සංවර්ධනය. | 1,250,719 | මෙම ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාව විසින් ඉටු කර ඇත. |
| (x) | කැටයාපතන උඩගම ප්‍රජා ශාලාව අසල සිට කැටයාපතන පාසල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම. | 1,230,884 | මෙම ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාව විසින් ඉටු කර ඇත. |
| (xi) | මෙරිගෝල්ඩ් නව ප්‍රජා ශාලාව ඉදි කිරීම. | 1,259,101 | ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ තත්ව වාර්තාව නොලැබීම. |
| (xii) | බෝමැල්ලගොඩ නාබොක්ක මාර්ගය සංවර්ධනය. | ඇස්තමේන්තු කර නැත. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. |
| (xiii) | බංගලා කොළණිය ඉහළ කෘෂි මාර්ගය රෝහල පාර සංවර්ධනය කිරීම. | 861,231 | මෙම ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාව විසින් ඉටු කර ඇත. |
| (xiv) | මුල්ඔය හන්දියේ සිට රුක්වුඩ් පාරේ සංවර්ධනය නොවූ කොටස් සංවර්ධනය. | 1,275,002 | කොන්ත්‍රාත්කරු ගිණුම් වර්ෂය තුළදී වැඩ අවසන් කර නොතිබුණු බැවින් අදාළ ගිවිසුම්ගත සමිතිය අසාධු ලේඛනගත කර ඇත. |
| (xv) | හෝප් වත්ත නව නිවාස යෝජනා ක්‍රමයට යන පාර සංවර්ධනය කිරීම. (උඩ කොටස අංක 09) | 628,923 | -එම- |

| | | | |
|---|---|---|---|
| (xvi) | පෙරිය රහන්වත්තට යන මාර්ගය සංවර්ධනය කිරීම. | 600,000 | ගිවිසුම්ගත වූ සමිතිය විසින් ව්‍යාපෘතිය ආරම්භකර නොතිබුණි. |
| (xvii) | බඹරකැලේ ෆැක්ටරි කොටස කෝවිල් පඩිපෙළ සංවර්ධනය කිරීම. | 400,000 | ගිවිසුම් ගත වූ සමිතිය විසින් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. |
| (xviii) | ජයලංකා කාණු පද්ධතිය සකස් කිරීම. | 1,000,000 | ගිවිසුම් ගත වූ සමිතිය විසින් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි . |
| (xix) | ඉල්ඩන්හෝල් වත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 1,000,000 | ගිවිසුම් ගත වූ සමිතිය විසින් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. |
| (xx) | කන්දෙඇල මාර්ගය සංවර්ධනය කිරීම. | 1,000,000 | ගිවිසුම් ගත වූ සමිතිය විසින් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. |
| (xxi) | සමඟි මාවත දෙවන අදියර සංවර්ධනය කිරීම. | 1,000,000 | ගිවිසුම් ගත වූ සමිතිය විසින් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. |

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

**--------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| | **ව්‍යාපෘතිය** | **ඇස්තමේන්තු ගත පිරිවැය** | **ආරම්භ කළ දිනය** | **2015 දෙසැම්බර් 31 දින වන විට වියදම** | **අත්හැර දැමීමට හේතු** |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | |
| (i) | රොබ්ගිල් වත්ත සිට ටින්සින් දක්වා මාර්ගය ඉදිකිරීම. | 625,000 | - | 98,000 | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මුලු මාර්ගයම සකස් කිරීම සඳහා යෝජනා කිරීම. |
| (ii) | යද්දල- තෙබුව මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 625,000 | - | 98,000 | මෙහි කොටසක් යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බැවින් ආරම්භක ස්ථානය පමණක් සකස් කර ගෙවීම් කිරීම |
| (iii) | යද්දල- තෙබුව මාර්ගය ඉදි කිරීම. | 1,250,000 | - | 218,920 | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | 506 E මඩුමාන ඇටඹඔය මඩුමාන දක්වා මාර්ගය. | 500,000 | 2015.09.08 | ඉඩම් ආරවුල් හේතුවෙන් ව්‍යාපෘතිය ඉටු නොකිරීම. |
| (v) | 506 E මඩුමාන දෙහිකොටුවේ සිට වැරැල්ලකැටිය පාර. | 500,000 | 2015.09.08 | -එම- |
| (vi) | 524 D දබ්බරේ කැටමිල්ලාගොඩ මාර්ගයේ බෝක්කුව ඉදි කිරීම. | 500,000 | 2015.10.10 | අයහපත් කාලගුණය හා ද්‍රව්‍ය සපයා ගැනීමේ අපහසුතාවය. |
| (vii) | 504 E කුරුඳු ඔය ඩාර්ලි වැලි කෝවිල් පාර සංවර්ධනය කිරීම. | 100,000 | 2015.11.29 | -එම- |
| (viii) | 518 උඩමාදුර විද්‍යාලයේ ප්‍රවේශ මාර්ගය. (ගම නැඟුම විශේෂ) | 300,000 | - | මෙම විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් සිදු කිරීමේදි එම ව්‍යාපෘතියේ කටයුතු සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමේදී මෙම ප්‍රවේශ මාර්ගය භාවිතා කරන බැවින් ක්‍රීඩා පිටියේ කටයුතු නිමවන තෙක් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කළ නොහැකි වීම හා ක්‍රිඩා පිටියේ ඉදිකිරීම් වර්ෂය තුළ නිම නොකිරීම. |

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**--------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිම කළ දිනය | 2015 දෙසැම්බර් 31 දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | -------------- | ----------- | ------------ | --------- | ---------- | ----------- | ------------ |
| | | රු: | | | | රු. | |
| (i) | බණ්ඩාරනායකපුර පානීය ජල ව්‍යාපෘතිය. | 700,000 | 2015.12.23 | 2015.12.31 | 2016.01.23 | 54,081 | කොන්ත්‍රාත්තුව භාර සමිතියේ ප්‍රමාදය |
| (ii) | අප්කට්, සමන් මහතාගේ නිවස අසල සිට ගම්මානය දක්වා මාර්ගය. | 148,499 | 2015.05.17 | 2015.08.14 | 2015.12.05 | 142,261 | අයහපත් කාලගුණය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (iii) | අප්කට් මාර්ගයේ සිට පොදු ජල ටැංකිය දක්වා මාර්ගය. | 148,565 | 2015.05.13 | 2015.0813 | 2015.12.20 | 142,565 | -එම- |
| (iv) | මස්කෙළිය කළ්‍යාණි බේකරිය අසල සිට DMD දක්වා පඩිපෙළ | 148,505 | 2015.05.05 | 2015.08.05 | 2015.09.03 | 142,505 | -එම- |
| (v) | මස්කෙළිය මූරි ස්ටෝස් සිට DMD දක්වා පඩිපෙළ | 148,457 | 2015.05.05 | 2015.08.05 | 2015.09.23 | 142,457 | -එම- |
| (vi) | පනම්ගම්මන පුවක්මල් පිදූගොඩ විහාරයේ දහම් පාසැල් ගොඩනැඟිල්ල ඉදිකිරීම. | 1,000,000 | 2015.07.21 | 2015.09.04 | - | 400,000 | කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය නිම නොකිරීම. |

**(ඇ) මුදල් නිදහස් කර තිබුණද, අරමුණු ඉටු නොවූ අවස්ථා**

අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වූ ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ ගිවිසුම් ගත මුදල රු.8,483,842 ක් වූ පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළ අත්‍යාවශ්‍ය කටයුතු ප්‍රදාන පත්‍රයට ඇතුළත් නොකර දිස්ත්‍රික් ඉංජිනේරු විසින් වරින්වර උපදෙස් ඒ සඳහා ලබා දී තිබුණි. කර්මාන්තයේ වැඩ ආරම්භ වී මාස 03 කට පසු ක්‍රීඩාංගණයේ වහල ඉදි කිරීමට අදාළ විස්තරාත්මක සැලැසුම් කොන්ත්‍රාත්කරුට ලබා දී තිබුණි. ගොඩනැඟිල්ලට පිවිසෙන පඩිපෙල වර්ෂාවට නිරාවරණය වන ලෙස සකසා තිබූ අතර වහලය ඉතා ඉහළින් ඉදිකර තිබීම නිසා වර්ෂා කාලයේ දී නැරඹුම් පඩි ද වර්ෂාවට නිරාවරණය වන තත්ත්වයක පැවතුණි. ගොඩනැඟිල්ලේ වැසිකිළි පහසුකම් හා ක්‍රීඩකයන්ට ඇඳුම් මාරු කිරීමට කාමරයක් හෝ නොමැතිව සැලැසුම් කර තිබූ අතර ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් කිරීම්වල ප්‍රමිතිය දුර්වල තත්වයක පැවතුණි. කොන්ත්‍රාත්කරුට රු.48,728 ක අධි ගෙවීමක් ද සිදු කර තිබුණි.

(ii) ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ ගිවිසුම්ගත මුදල රු.1,786,400 ක් වූ අධිකාරිගම පොදු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේ කර්මාන්තය ඉටු කිරිමේදී ක්‍රීඩා පිටිය මධ්‍යයේ මතු වී තිබූ කළුගල් ඉවත් කර නොතිබූ අතර ඇස්තමේන්තු කළ පරිදි ක්‍රීඩා පිටිය වටා කාණු පද්ධතියද ඉදි කර නොතිබීමෙන් පස සෝදා යාමේ අවදානමක් තිබුණි.

(iii) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කළ ගල්පාලම දහම් පාසලේ පොදු පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළ ගොඩනැගිල්ලේ බිත්ති අඩි 3 ක් පමණක් උසට බැඳීමට ඇස්තමේන්තු කර තිබුණි. පවතින සුළං තත්ත්වය හා වැසි කාලවලදී එම ගොඩනැගිල්ල භාවිතා කිරීමට අපහසු වූ බැවින්

ගොඩනැගිල්ල 2016 මැයි 13 දින වන විටත් ඌන උපයෝජිතව පැවතුණි. 9" ගඩොල් බිත්ති වෙනුවට 6 " බිත්ති යොදා තිබූ අතර, ඉංජිනේරු ගඩොල වෙනුවට ඊට වඩා විශාල ප්‍රමාණයේ රජයේ ගොඩනැගිලි සඳහා අනුමත නොකරන ගඩොල් යොදා තිබුණි. ගෙවීම් කළ ප්‍රමාණයට වඩා $2.29m^3$ අඩුවෙන් බිත්ති නිමවා තිබූ අතර, ඇස්තමේන්තුගත ප්‍රමිතියෙන් තොර ඉදිකිරීමට රු.65,732 ක් ගෙවීම් කර තිබුණි. තලාදවල පොටි යොදා සම්පූර්ණ කර නොතිබුණද, රු.97,574 ක් ඒ සඳහා ගෙවා කර තිබුණි.

(iv) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ක්‍රියාත්මක කළ රත්නගිරිය ජනපදයේ පළමු පටුමග ඉදිකිරීම් ව්‍යාපෘතියේ මාර්ගය සඳහා කොන්ක්‍රීට් 75.6 $m^3$ යෙදීමට ඇස්තමේන්තු කර තිබුණි. මාර්ගය සඳහා කොන්ක්‍රීට් 41.76 $m^3$ හෙවත් සියයට 55 ක් පමණක් යොදා තිබුණි. මාර්ගය කපා පස් පුරවා දෙපස බැමි ඉදිකිරීමට ඇස්තමේන්තු කර තිබුණද, මාර්ගය දැඩි බෑවුමක් සහිතව කපා තිබුණි. එය කොන්ක්‍රීට් කළද ත්‍රිරෝද රථයකට පවා ගමන් කිරීමට අපහසු තත්ත්වයක පැවැතුණි. දෙපස බැමි ඉදි නොකිරීම නිසා මාර්ගයේ පිරවූ පස් සෝදා පාලුවට ලක් වී තිබුණි.

(v) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ක්‍රියාත්මක කළ වටගොඩ ඉහල කොටසට ජලය ලබා දීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2015 දෙසැම්බර් 31 දින නිම කර රු.772,553 ක් ගෙවා තිබුණි. නමුත් ජල ටැංකියේ සිට පහලට ජලය ගෙන යන බට පොළොව මතුපිට අනාරක්ෂිතව යොදා තිබුණි. මෙම ජල ටැංකිය ස්වාභාවිකව ඇලක් හරස්කර ඉදිකර තිබුණු බැවින් ජනතාවට ලබා දෙන ජලය පිරිසිදු තත්ත්වයක නොපවතින බව නිරීක්ෂණය වු අතර, 2016 අප්‍රේල් 26 දින වන විට ඇල මාර්ගයේ ජලය සියයට 80 ක් පමණ සිඳී තිබුණි. ඒ අනුව ජලය රහිත කාලවලදී ප්‍රයෝජනයට ගත නොහැකි බැවින් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.

**(ඉ) ව්‍යාපෘති අවිධිමත් ලෙස ක්‍රියාත්මක කර තිබුණු අවස්ථා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී නිල නිවස ඉදි කිරීමට රු.7,519,693 ක් වැය කර තිබුණි. 2016 පෙබරවාරි 18 දින වන විට ද එහි පදිංචියට සුදුසු ආකාරයට ඉදිකිරීම් නිම කර නොතිබුණි. පිවිසුම් මාර්ගයේ හා ගොඩනැගිලි වටා වූ දැල් ආවරණයේ ඉදි කිරීම දුර්වල මට්ටමක පැවතුණි. පැති බැම්ම ඉදි කිරීම සඳහා පස් $154m^3$ ක් ඉවත් කර තිබුණත්, භූමියෙන් පස් $317.69m^3$ ක් කි.මී. 10 ක දුරකට ප්‍රවාහනය කර රු.98,801 ක අමතර ගෙවීමක් කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වයට අනුමත කළ හැකි කොන්ත්‍රාත්තුවේ උපරිම විචලනය සියයට 10 ක් විය යුතු වුවත්, මෙම කර්මාන්තයේ 2015 ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තුගත සීමාව සියයට 13 කින් ඉක්මවා අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියකින් තොරව අමතර වැඩ ඉටු කර තිබුණි.

(ii) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාම කොත්මලේ ප්‍රාදේශිය ලේකම් නිල නිවස ඉදිකිරීමේ කටයුතු කර තිබූ අතර වසර 3 ක් තුළ රු.10,835,938 ක වැඩ කොටස් ඉටු කර තිබුණි. 2016 පෙබරවාරි 18 දින වන විට ද එහි පදිංචියට සුදුසු තත්ත්වයක ඉදිකිරීම් නිම කර නොතිබුණි. ගොඩනැගිල්ලේ පිටුපස මාර්ගය, ගොඩනැගිල්ල වටා

දැල් ආවරණවල නිමාව දුර්වල තත්ත්වයක පැවති අතර පොළොව කොන්ක්‍රීට් කර සුද මැදීමට 2014 වර්ෂයේදී රු.179,730 ක් ගෙවා තිබුණි. 2015 වර්ෂයේදී එහි කොටසක් ටයිල් ඇතිරීම සඳහා රු.283,614 ක් වැය කිරීම නිසා රජයට මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි. පැති බැම්ම ඉදි කිරීම සඳහා පස් 51.44m$^3$ ක් ඉවත් කිරීමට ඇස්තමේන්තු කර තිබුණද, පස් 305.13m$^3$ ඉවත් කළ ලෙස රු.202,952 ක් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන අස්ථිත්වයට අනුමත කළ හැකි උපරිම කොන්ත්‍රාත් විචලනය සියයට 10 ක් විය යුතු වුව ද, අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියකින් තොරව ඇස්තමේන්තුවට වඩා සියයට 22 ක අමතර වැඩ කොටස් ඉටු කර තිබුණි.

(iii) ගිවිසුම්ගත මුදල රු.3,538,350 ක් වු හඟුරන්කෙත සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ ක්‍රීඩා පිටිය ඉදිකිරීමේ කර්මාන්තය 2015 දෙසැම්බර් 20 දිනට පෙර නිම කළ යුතු වුවද, 2016 පෙබරවාරි 29 දින වන විටත් එය නිමකර නොතිබුණි. කාණු පද්ධතියේ ඉදිකිරීම් සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විට රු.570,000 ක් ගෙවීම් කළද, 2016 පෙබරවාරි 29 දින වන විටත් එහි මූලික අදියරේ කටයුතු සිදු කෙරෙමින් පැවැතුණි. ක්‍රිඩාංගණය වටා ඉදිකළ දැල් ආවරණය ඇස්තමේන්තුවේ නියමයන්ගෙන් බැහැරව තිබුණ ද, ඒ සඳහා රු.585,000 ක් ගෙවා තිබුණි. පිවිසුම් මාර්ගය ආනතව සැකසීමට සිදු වන බැවින් ක්‍රීඩාංගණයේ අඩි 15-20 ක් පමණ පළලින් යුත් ප්‍රදේශයක් නිෂ්කාර්යව පැවැතුණි.

(iv). අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ඉහළ මහලේ ඉතිරි වැඩ නිම කිරීමේ කර්මාන්තය නිම කළ බවට 2015 දෙසැම්බර් 31 දින රු.6,703,665 ක් ගෙවා තිබුණද, ඒ තුළ වූ රු.331,534 ක් වූ වැඩ විෂයයන් 02 ක් 2016 පෙබරවාරි 16 දින වන විටත් ඉටු කර නොතිබුණි. වැඩ විෂය අංක 04 යටතේ රු.347,700 ක අධි ගෙවීමක්ද, වැඩ විෂය අංක 13 යටතේ රු.349,393 ක අධිගෙවීමක්ද සිදු කර තිබු අතර, විධිමත් අනුමැතියකින් තොරව අමතර වැඩ විෂයයන් 08 ක් සඳහා රු.528,179 ක් ගෙවා තිබුණි. මෙම කර්මාන්තය 2015 දෙසැම්බර් 28 දින වන විට නිම කළ යුතු වුවද, කාලය දීර්ඝ කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් 2016 පෙබරවාරි 16 දින වන විට අවම වශයෙන් අයවිය යුතු රු.172,215 ක ප්‍රමාද ගාස්තු රජයට අහිමිව තිබුණි. ඉදිකිරීම් කටයුතු නිම කර 2016 මැයි 25 දින වන විටත් කොන්ත්‍රාත්කරු විසින් ගොඩනැගිල්ල ප්‍රාදේශීය ලේකම්වරයා වෙත භාරදී නොතිබුණි.

## 3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 හා 2015 වර්ෂවලට අදාල විශ්‍රාම වැටුප් රු.218,119 ක් අදාල විශ්‍රාමිකයින්ට නොගෙවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් දිවිනැගුම ප්‍රජාමූල බැංකු /බැංකු සමිති 07 න් 03 ක වසර ගණනාවක සිට මෙහෙයුම් අලාභයක් පැවතුණි. බොල්ණය රු.4,730,683 ක් පැවතීම හා සමෘද්ධි ලාභින්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා එක් සමෘද්ධිලාභියෙකුට රු.2,500 බැගින් දෙනු ලැබූ මුදලින් රු.22,712,997 ක මුදලක් ප්‍රතිපූර්ණය නොවී පැවතීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3.12 අවිධිමත් ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 මාර්ගෝපදේශය අනුව විශාල කොන්ත්‍රාත්තු සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බැහැර සමාජිකයෙකු ප්‍රසම්පාදන කටයුතු සඳහා යොදවා නොගෙන ප්‍රසම්පාදන අස්ථිත්වයේ අයෙකු තෙවන සාමාජිකයා ලෙස යොදවා ගෙන රු.76,906,691 ක් වූ ප්‍රසම්පාදන තීරණ 15 ක් ගෙන තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 මාර්ගෝපදේශයෙන් ආවරණය නොවී තිබියදී රු.67,822,675 ක සීමිත ලංසු කැඳවීම් කර ප්‍රසම්පාදන තීරණ ලබා ගෙන තිබුණි.

(iii) 2015 ප්‍රසම්පාදන සැලැස්මට අනුව මූලධන වැය විෂයයන් 05 ක් සඳහා සළසා තිබුණු රු.13,750,000 ප්‍රතිපාදනවලින් ජාතික තරඟකාරි ලංසු කැඳවීමකින් ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු වුවද, වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය යොදා ගනිමින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි.

(iv) ප්‍රසම්පාදන සැලැස්ම අනුව මාර්තු මාසයේ ආරම්භ කළ යුතු ප්‍රසම්පාදන කටයුතු 2015 ජුලි මාසය වන විටත් ප්‍රමාද කර ආරම්භ කර තිබුණි.

(v) ප්‍රසම්පාදන සැලැස්මෙන් අනුමත ව්‍යාපෘති 05 ක් වෙනුවට ව්‍යාපෘති 03 ක් ක්‍රියාවට නැංවීම නිසා රු. මිලියන 20.6 ක් වූ එම ව්‍යාපෘති 3න් 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2.6 ක පමණක් වැඩ නිමකර තිබුණි.

(vi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1:2 හා 3.3 මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව සීමිත මිල ගණන් කැඳවීමෙන්, අතින් මිල ගණන් ලබා ගැනීමෙන්, ලංසු විවෘත කරන දිනට පසුව ඉදිරිපත් කළ ලංසු පිළිගැනීමෙන්, ප්‍රමාණවත් ලංසු නොමැතිව ප්‍රසම්පාදන පිරිනැමීමෙන් හා එකම ආයතනයෙන් විවිධ නම් වලින් ඉදිරිපත් කළ ලංසු පදනම් කර ප්‍රසම්පාදන පිරිනැමීමෙන් ආදි කිසිදු විනිවිදභාවයකින් තොරව වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වර්ෂය තුළ එකතුව රු.4,051,317 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.

## 3.13 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදනමත ක්‍රියාත්මක කළ ගිවිසුම් ගත මුදල රු.2,010,000 ක් වූ උනන්තැන්න පොදු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේදී පිට්ටනියට පිටතින් පස් 367m$^3$ක් ගෙන්වීමට ඇස්තමේන්තු කර තිබුණද, පිට්ටනියට යෙදූ (1204.8m$^3$ ක් වූ) සියළු පස් පිටතින් සපයා ගත් ප්‍රකාශ කර රු.843,360 ක් ගෙවා තිබුණි. මේ නිසා ඇස්තමේන්තුවේ සඳහන් වටිනාකම රු.586,400 කින් ඉක්මවා ගෙවීම් කර තිබුණි.

(ආ) දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් ගිවිසුම පරිදි රු.114,410ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි.

(ඇ) දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේදි රජයේ අනුමත ඉංජිනේරු ගඩොල් වෙනුවට රජයේ ගොඩනැගිලි සඳහා අනුමත නොවූ ගඩොල් යොදාගෙන රු.940,800 ක ගෙවීම් කර තිබුණි.

(ඈ) 2015 සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශයේ රු.1,000,000 ක ප්‍රතිපාදන යටතේ ආලෝකබැද්ද මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කර රු.980,000 ක් ගෙවීම් කර ඇති නමුත්, 2015 දෙසැම්බර් 25 දින තාප්පය කඩා වැටී තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අලාභ හානි නිශ්චය කර වගකිව යුතු නිලධාරින් සම්බන්ධව විනය ක්‍රියා මාර්ග ගැනීමක් හෝ අලාභ අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.14 විසඳා නොතිබුණු විගණන ඡේද**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2012 | 1.8.(අ)VII | අවිධිමත් ගනුදෙනු |
| 2013 | 1.7. (අ) I, II | වත්කම් කළමනාකරණය |
| 2013 | 1.7 (ඇ) | වත්කම් කළමනාකරණය |
| 2013 | 1.8(අ) V. II | අනුකූල නොවීම් |
| | 1,14 .III | කළමනාකරණ දූර්වලතා |
| 2014 | 3.8 | වත්කම් කළමනාකරණය |
| | 3.9 | අනුකූල නොවීම්. |
| | 3.11 | අවිධිමත් ගනුදෙනු |
| | 3.14 | කළමනාකරණ දූර්වලතා |

**3.15 කළමනාකරණ දූර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක් විසින් ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනා ගෙවීම සඳහා 2015 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා තැපැල් කාර්යාල වෙත ප්‍රේෂණය කරන ලද රු.72,948,000 ක මුදලින් රු.3,340,000 ක් නොගෙවා ආපසු එවා තිබුණි. මෙම දීමනාව ලැබිය යුතු අය නිවැරදිව හඳුනාගැනීම හා පසු විපරම් කටයුතු සිදු කිරීම දූර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2013 ජූලි 18 දිනැති අංක 01/2013 දරන ජා.ආ.ස.සේ.ම. මාර්ගෝපදේශ අනුව ආපදාව සිදුවී වසරක් තුළ නිවාස සහනාධාර ගෙවීම් අවසන් කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක 2014 හා 2015 වර්ෂවලදී ආපදාවට පත් නිවාස 138 ක් වෙනුවෙන් 2015 නොවැම්බර් වන විටද රු.15,319,955 ක සහනාධාර ලබාදී නොතිබුණි.

(ඈ) ගිණිගත්හේන හැටන් සහ විදුලිපුර ප්‍රජා මූල බැංකුවල රු.5,320,984 ක් වටිනා කොටස් මුදල් හා තැන්පත් මුදල් නිෂ්කාර්යව පැවතිණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට 1982 වර්ෂයේ සිට ලැබී තිබුණු ඉඩම් දීමනා පත්‍ර 116 ක් අදාළ අයට ලබාදීමට හෝ අවලංගු කිරීමට හෝ කටයුතු නොකර අත රඳවාගෙන තිබුණි.

(ඉ) 1997 ඔක්තෝබර් 10 දින නිකුත් කරන ලද සමෘද්ධි බැංකු සංගම් මෙහෙයුම් පත්‍රිකා අංක 4 ට දෙවැනි එකතුව ලෙස නිකුත් කළ මහ පෙන්වීමේ 3.7 උප ඡේදය පරිදි බොල්ණය වෙන් කිරීම් පසු කාලීනව ණයකරුවන්ගෙන් අයකරගත යුතු වුවද, 2015 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 ක රු.5,649,885 ක් අයකර ගෙන නොතිබුණි.

(ඊ) ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2012 මැයි 24 දිනැති අංක 4/3/1/201/48 දරන ලිපිය ප්‍රකාරව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සති 72 ක කාලයක් තුළ සිදු කළ යුතු වුවද, 2006 වර්ෂයේ සිට 2014 මාර්තු මාසය දක්වා කාලය තුළ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා තැන්පත් කරන ලද රු.13,679,810 ක් අදාළ කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණි. ප්‍රමාද වී වන්දි ගෙවීමේදී අධික පොලියක් ගෙවීමට සිදුවීමේ අවදානමක් පැවතුණි.

(උ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක ප්‍රජා මූල බැංකු 07 ක් යටතේ 2015 සැප්තැම්බර් 30 දිනට අයවිය යුතු මිහිජය සහන පොලී ණය ශේෂය රු.3,388,885 ක් හා ජන පුබුදු පොලී ණය ශේෂය රු.3,100,718 ක් අයකර ගෙන නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරන ලද බැංකු සංගම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 24 අනුව දිරිය මාතා ගිණුම් අරඹා එහි අරමුණු හා ඉලක්ක සපුරා ගත යුතු වුවද, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2007 වර්ෂයේ සිට ආරම්භ කළ දිරිය මාතා ගිණුම්වල රු.451,166 ක් නිෂ්කාර්යව පැවතුණි.

(එ) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි බැංකුවල සාමාජික කොටස් මුදල් හා තැන්පත් මුදල් රු.5,963,432 ක් නිෂ්කාර්යව පැවතුණි.

(ඒ) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිවිනැගුම මූල්‍ය බැංකුව මගින් ජීවනෝපාය ව්‍යාපෘති සඳහා සමෘද්ධිලාභීන්ගේ ගිණුම්වලට බැරකර තිබූ රු.432,575 ක් එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා නිෂ්කාර්යව පැවතුණි.

(ඔ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ප්‍රජාමූල බැංකුවල රු.27,319,427 ක් වටිනා කොටස් මුදල් හා තැන්පත් මුදල් අක්‍රීයව පැවතුණි.

(ඕ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ක්‍රියාත්මක කළ පාර්ක් බණ්ඩාරණායක අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීමේදි රු.19,055 ක අධි ගෙවීමක් සිදු කර තිබුණි. රසායනාගාර වාර්තාව අනුව එක් සාම්පලයක් නිසි ප්‍රමිතියෙන් යුක්ත වුවද, අනෙක් සාම්පලය ප්‍රමිතියෙන් තොර විය. නමුත් කාර්මික නිලධාරි විසින් ලබාදුන් නිර්දේශයකට අනුව රඳවාගත් රු.196,000 ක් 2016 මාර්තු 30 දින නිදහස් කර තිබුණි.

(ක) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කළ නැගෙනහිර කඳපොල ජිනේද්‍රාරාම දහම් පාසලේ ගොඩනැගිල්ල ඉදිකිරීමේදි යොදා තිබූ බ්ලොක්ගල් ප්‍රමිතියෙන් තොර වූ අතර, බිත්ති බැඳීමේ නිමාවද ඉතා දුර්වල විය. ඒ සඳහා රු.248,157 ක් ගෙවා තිබුණි. ගොඩනැගිල්ලේ තෙවන මහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉදිකර තිබූ අතර, තෙවන මහලක් ඉදිකරන්නේ නම් ඒ සඳහා ප්‍රමාණවත් කුලුණු දෙවන මහලේ පැවතිය යුතු නමුත්

තෙවන මහලේ දෙවන මහල හා සම්බන්ධ වන ශක්තිමත් කුලුණු නොතිබුණි. එල 4 කින් යුක්තව දැවයෙන් නිමකර තිබු වහල එල දෙකක් ලෙස මිනුම් දක්වා තිබීමෙන් මිනුම්ගත නොහැකි විය .BSR රේටයන්හි R043, R 044, R045 අනුව වහලයකට යොදන දැව සඳහා BSR රේටයන් තිබුණද, මෙහිදි කාර්මික නිලධාරි විසින් SSR රේටයන් සකස් කර රු.382,867 ක් ගෙවීම් කර තිබුණි.

**3.16 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 25 | 9 | 1 |
| (ii) | තෘතීයික මට්ටම | 16 | 9 | 7 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 845 | 740 | 108 | 3 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 82 | 75 | 10 | 3 |
| | එකතුව | 976 | 849 | 134 | 7 |